සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 07 - 2023

# භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ ..............................................................................................................................

උපදෙස්: 1 කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. 11 කොටසට වෙනම කොළයක පිළිතුරු සපයන්න. 11 කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයන්න.

## 1 කොටස

➢ අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01) සමක විශ්කම්භයත් ධ්‍රැවක විශ්කම්භයත් අතර වෙනස කි. මී. .............................. පමණ වේ.

(34, 43, 27)

02) $0^0$ දේශාංශය ........................................... ලෙස හැදින්වේ.

(ග්‍රිනිච් රේඛාව, සම්මත දින රේඛාව, සමකය)

03) ලෝකයේ කුඩාම සාගරය ලෙස සැළකෙන්නේ ..................................... සාගරයයි.

(ආර්ක්ටික්, ඇන්ටාටික්, පැසිපික් )

04) ඊසානදිග මෝසම් සුළං ක්‍රියාත්මක වන්නේ .................................................. යන මාස අතරය.

(මාර්තු අප්‍රේල්, මැයි සැප්තැම්බර්, දෙසැම්බර් පෙබරවාරි)

05) 1: 50 000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියම් වල සෙ.මී. 10 න් සැබෑ භූමියේ කි.මී. .......... නිරූපනය වේ.

( 5, 10, 20)

➢ ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ✓ ලකුණද වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06) ජාතික සිතියම් සංග්‍රහය ශ්‍රී ලංකාවේ විවිධ සිතියම් පරිශීලනයට ඇති සුදුසුම ග්‍රන්ථයයි. (.....)

07) වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා මානසික ආතතිය වැඩිවීම වැනි රෝග තත්ත්ව ඇති වේ. (.....)

08) භූමිකම්පාවකින් ඇතිවන ආපදා තත්ත්වයකින් මිදීමට ප්‍රමාණවත් කාලයක් පවතී. (.....)

09) ඩෙල්ෆ් දූපත ශ්‍රී ලංකාවට අයත් විශාලතම දූපතයි. (.....)

10) දකුණු ආසියාතික රටවල් අතරින් ආයු අපේක්ෂාව, සාක්ෂරතාවය වැනි දර්ශක වලින් ඉදිරියෙන්ම සිටින්නේ මාලදිවයිනයි. (.....)

➢ **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

**11)** මධ්‍යම කඳුකරයේ කඳුවැටි අතරින් උතුරින්ම පිහිටි කඳු වැටිය .......................... කඳුවැටියයි.

**12)** වලවේ ගඟ හා .................................. තෙත් කලාපය හා වියලි කලාපය වෙන් කිරීමට භාවිතා කර ඇති භෞතික ලක්ෂණයකි.

**13)** ශ්‍රී ලංකාවේ පිහිටි .......................................... වනාන්තරය ලෝක උරුමයක් ලෙස නම් කර ඇති ස්වාභාවික නිර්මිතයකි.

**14)** මුහුදු පත්ලේ ඇතිවන භූමිකම්පා, නායයෑම් හා ගිනිකඳු වැනි උපද්‍රව නිසා ................................ ඇති වේ.

**15)** ශ්‍රී ලංකාවේ මීටර් ............................ වඩා උස් බිම් කඳුකර භූ දර්ශනයට අයත් සේ සැළකේ.

➢ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**16)** ශ්‍රී ලංකාවට ආසන්නයේ ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් ලෙස සැළකිය හැක්කේ,

1. තස්මේනියාවයි. 2. අයිස්ලන්තයයි. 3. නිකෝබාරයයි. 4. සිසිලියයි.

**17)** ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර තැනිතලාවේ පිහිටි භූ ලක්ෂණයක් දැක්වෙන පිළිතුර කුමක්ද?

1. කලපු 2. සානු 3. දූර්ග (කපොලු) 4. සමාන්තර හෙල්වැටි

**18)** ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ සානුවක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. හපුතලේ 2. වැලිමඩ 3. කඩුගන්නාව 4. නමුණුකුල


**19)** ශ්‍රී ලංකාව හරහා යන දේශාංශ රේඛාවක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. නැ.දේ. $60^0$ 2. බ.දේ. $60^0$ 3. නැ.දේ. $80^0$ 4. බ.දේ.$80^0$

**20)** කඩොලාන ශාකයක දැකිය හැකි අනුවර්තන ලක්ෂණයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ශීත ඍතුවේදී කොළ හැලීම 2. මාංශල පත්‍ර පැවතීම
3. වායුධර මුල් පැවතීම 4. දිගු මූල පද්ධතියක් පැවතීම

# 11 කොටස




**01)** අ) i. සිතියමක සූචකයෙන් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. **(2)**

ii. අප භාවිතා කරන සිතියම් වර්ග දෙකක නම් ලියන්න. **(2)**

iii. සිතියමක් පිටලස් කිරීමේ පියවර ලියා දක්වන්න. **(3)**

ආ) i. පහත දකුණු ආසියා කලාප සිතියමේ **A** සිට **G** දක්වා රටවල් අක්ෂර පිළිවෙළින් ලියන්න. **(7)**

ii. දකුණු ආසියාවේ රටවල් අතරින් සාක්ෂරතාවය ඉහළ රටවල් දෙකක් නම් කරන්න. **(2)**

**02)** i. ශ්‍රී ලංකාවේ භූවිෂමතා කලාප තුන නම් කරන්න. **(3)**

ii. ඉහත නම් කළ එකිනෙක භූ විෂමතා කලාපයේ හඳුනාගත හැකි භූ ලක්ෂණ දෙක බැගින් ලියන්න. **(6)**

iii. ඕනෑම භූ විෂමතා කලාපයක ප්‍රමුඛ ආර්ථික කටයුතු දෙකක් සඳහන් කරන්න. **(2)**

**03)** i. ජාතික උරුම වර්ග දෙක නම් කරන්න. **(2)**

ii. පහත දැක්වෙන ජාතික උරුම මානව නිර්මිත හා ස්වාභාවික නිර්මිත ලෙස වර්ග කර දක්වන්න. **(3)**

(සීගිරිය, සිංහරාජය, කූට්ටන් පොකුණ, නල්ලූර් කොවිල, උණුදිය උල්පත්, දිය ඇලි)

iii. අ). ශ්‍රී ලංකාවේ වෙසෙන ආදිවාසීන් හඳුන්වන නම කුමක්ද? **(2)**

ආ) එම ආදිවාසීන් ජීවත්වන ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. **(2)**

iv. ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ දැකිය හැකි මෑත කාලීන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. **(2)**

**04)** i. තෙත් කලාපයෙන් මුහුදට ගලා බසින ගංගා තුනක් නම් කරන්න. **(3)**

ii. තෙත් කලාපයේ ජනතාව මුහුණ දෙන ස්වාභාවික උපද්‍රව දෙකක් දක්වන්න. **(2)**

iii. තෙත් කලාපය ජනාකීර්ණ වීම සඳහා හේතු වී ඇති සාධක දෙකක් පෙන්වා දෙන්න. **(4)**

iv. වර්තමානයේ තෙත් කලාපීය ජනතාව මුහුණ දෙන අභියෝග දෙකක් දක්වන්න. **(2)**

**05)** i. උපද්‍රවයක් යන්න හඳුන්වන්න. **(2)**

ii. ස්වාභාවික උපද්‍රව බහුල වීමට හේතුවී ඇති මානුෂ ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න. **(3)**

iii. පහත දැක්වෙන දිස්ත්‍රික්ක මුහුණදෙන සුවිශේෂී ස්වාභාවික උපද්‍රව අනුව කාණ්ඩ කර දක්වන්න. **(3)**

( අනුරාධපුර, ගාල්ල, නුවරඑළිය, අම්පාර, බදුල්ල, කළුතර) (ජලගැලීම්/නියඟය/නායයෑම්)

iv. ආපදා කළමණාකරණයේ අවස්ථා තුන නම් කරන්න. **(3)**

**06)** i. දේශගුණ වෙනස්වීම් යනු කුමක්ද ? **(2)**

ii. දේශගුණ වෙනස්වීම් ඇතිවීමට හේතු තුනක් දක්වන්න. **(3)**

iii. දේශගුණ වෙනස්වීම් වලින් ශ්‍රී ලංකාවට ඇතිවන බලපෑම් තුනක් ලියන්න. **(3)**

iv. දේශගුණ වෙනස්වීම් වල බලපෑම අවම කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් දක්වන්න . **(3)**

07) i. ඉදිරියේ ඇති සිතියමේ අංක 1,2,3,4,5, න් දක්වා ඇති දිස්ත්‍රික් අංක පිළිවෙළින් නම් කරන්න. (5)

ii. සිතියමේ දැක්වෙන A, B, C, දූපත් නම් කරන්න. (3)

iii. යාපන අර්ධද්වීපයේ වැදගත් ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (3).

